21. 1, 2, 3, 4 සහ 5 යන සංඛ්‍යාංක පමණක් භාවිතා කොට(පුනරාවර්තනය කල හැක) සෑදිය හැකි සංඛ්‍යාංක 5කින් යුත් සංඛ්‍යා සියල්ලගේම එකතුවෙහි අවසාන සංඛ්‍යාංක තුන වනුයේ,

(A) 725 (B) 775 (C) 825 (D) 875 (E) 925

22. 1 එ'වා 100ක් සහ 2 එ'වා 50ක් කළු ලෑල්ලක් මත ලියා ඇත. ලෑල්ල මත එක ඉලක්කමක් පමණක් ඉතුරු වන තුරු පහත ක්‍රියාව කරනු ලැබේ: ඉලක්කම් දෙකක් මකා දමා ඒ' දෙක සමාන නම් 1ද අසමාන නම් 2 ද ලියනු ලැබේ. පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

I ඉහත ක්‍රියාව හරියටම 75 වතාවක් කිරීමෙන් ලෑල්ල මත ඉතිරිව ඇති ඉලක්කම් වල එකතුව ඔත්තේ වේ.

II ඉහත ක්‍රියාව හරියටම 149 වතාවක් කිරීමෙන් ලෑල්ල මත ඉතිරිව ඇත්තේ 1 පමණි

III ඉහත ක්‍රියාව හරියටම 149 වතාවක් කිරීමෙන් ලෑල්ල මත ඉතිරිව ඇත්තේ 2 පමණි

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ II පමණි (E) කිසිවක් නොමැත

23. $A = \{p_1, p_2, \dots, p_n\}$ යනු ශූන්‍ය නොවන ප්‍රභින්න ප්‍රථමක සංඛ්‍යා වලින් සැදි කුලකයකි. $x = p_1 p_2 \dots p_n + 1$ නම් ඔබට කිවහැක්කේ කුමක්ද?

I $i = 1, 2, \dots, n$ සඳහා x, p_i ගෙන් බෙදූ විට ශේෂය 1වේ

II එක්කෝ x ප්‍රථමක වේ, නැත්නම් xට A හි නොමැති ප්‍රථමක සාධකයක් පවතී

III x පූර්ණ වර්ගයක් විය නොහැක

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) Iහ සහ II පමණි (E) සියල්ලම

24. සරත් සහ මීනා 8×9 සමචතුරස්‍ර දැල් ඇති පිටුවක් මත පහත ක්‍රීඩාව සිදු කරයි: ඔවුන් මාරුවෙන් මාරුවට පේළියක් හෝ තීරයක් කපා දමන්නේ එම පේළියේ හෝ තීරයේ කපා නොදැමූ කොටුවක් ඇත්නම් පමණි. පේළියක් හෝ තීරයක් කපා දැමීමට අපොහොසත් වන ක්‍රීඩකයා පරාජය වේ. ඔබට කිව හැක්කේ කුමක්ද?

I පළමු ක්‍රඩකයාට ජයගැනීමට ක්‍රමවේදයක් ඇත
II 2×2 කපා නොදැමූ සමචතුරස්‍ර දැලක් අනෙක් ක්‍රීඩකයාට ඉතුරු කරන ක්‍රීඩකයාට ජයගත හැක
III දෙවන ක්‍රීඩකයාට ජයගැනීමට ක්‍රමවේදයක් ඇත

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ III පමණි (E) කිසිවක් නොමැත

25. මෙවර බොරුකාරයින්ගේ දේශයේ පැවැත්වුනු මහා මැතිවරණයෙන් *Gullible* දිස්ත්‍රික්කයට රතු කල්ලි සාමාජිකයන්ගේ පක්ෂයෙන් තිදෙනෙක් තේරී පත් විය. මිනිසුන් 100දෙනෙකුගේ ඡන්ද අතුරින් එම තිදෙනා ; *The Protector of Land of Liars, I. M. Your Servant* සහ *The Pride of Gullible* පිළිවෙලින් ඡන්ද 90, 60 සහ 57 බැගින් ලබාගත් අතර මිනිසුන් 5දෙනෙකු තම ඡන්දය මෙම තිදෙනාගෙන් එක් අයකුටවත් දී නැත. මොවුන් තිදෙනාටම ඡන්දය ලබා දුන් පුද්ගලයින් ගණන උපරිම වශයෙන් කීයක් වේද?

(A) 36 (B) 45 (C) 50 (D) 53 (E) 56

6. *AB* සහ *CD* දිගවල් පිළිවලින් 6 cm හා 8 cm නම් *EF* හි දිග වනුයේ,



(A) 6.5 cm (B) 7 cm (C) 7.5 cm (D) 8 cm (E) 8.5 cm

7. කාසි 3ක් අතුරෙන් එක් කාසියක් ව්‍යාජ කාසියක් වන අතර එහි බර, සමාන බර ඇති සැබෑ කාසි දෙකෙහි බරට වඩා අඩු ය. මෙම ව්‍යාජ කාසිය භාර රහිත තැටි තුලාවක(සමබර තුලාවක) භාවිතයෙන් සෙවීමට අවශ්‍ය අවම බර කිරීම් ගණන කොපමණද?

(A) 1 (B) 2 (C) 3 (D) 4 (E) 5

8. නගර හයක් ඇත. සෑම නගරයකම සිට කෙලින්ම සම්බන්ධ දුම්රිය මාර්ග ඇත්තේ වෙනත් නගර දෙකකට පමණි. එම දුම්රිය මාර්ගයක දිග 100km වේ නම් දුම්රිය මාර්ග වල මුළු දිග කොපමණද?

(A) 300km (B) 600km (C) 900km (D) 1200km (E) 1500km

9. පහත දැක්වෙන නිවැරදිව සුළු කරන ලද ද්විමය එකතු කිරීමේ ගැටලුවේ සෑම අකුරක්ම 0 හෝ 1 නිරූපනය කරන අතර ඒ'වා එකිනෙකට අසමාන වීම අනිවාර්ය නොවේ. $I=M=S=1$ සහ $H=0$ නම්, *EASY* වලට ගත හැකි වැඩිතම අගය දහයේ පාදයෙන් කීයද?

```
   M A T H
+      I S
  E A S Y
```

(A) 5 (B) 9 (C) 11 (D) 15 (E) 17

10. අප්‍රේල් මස හරියටම අඟහරුවාදාවන් 4ක්, බ්‍රහස්පතින්දාවන් 4ක් සහ සෙනසුරාදාවන් 4ක් තිබෙන පරිදි වූ වසරක අප්‍රේල් 24 කුමන දිනයක්ද?

(A) සඳුදා (B) අඟහරුවාදා (C) බ්‍රහස්පතින්දා (D) සිකුරාදා (E) සෙනසුරාදා